www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියාවේ මැතිවරනයඃ කොංග්‍රස් පක්ෂයේ කඩාවැටීම සහ බාදනය

## India's elections: the decline and decay of the Congress Party

**දීපාල් ජයසේකර විසිනි**
**2004 අප්‍රේල් 23**

දැන් ඉන්දියාවේ පැවැත්වෙන මැතිවරනයේ දී, පාලක භාරතීය ජනතා පක්ෂයේ (බීජේපී) ප්‍රධාන විරුද්ධවාදියා වන්නේ, ඉන්දියානු ජාතික කොංග්‍රසයයි -- එනම්, දහ නව වන හා විසි වන ශත වර්ෂවල විජිත-විරෝධී අරගල දක්වා අතීතයට දිවෙන මූලයන් සහිත, සම්ප්‍රදායික ජාතික ධනේශ්වර පක්ෂයයි.

1947 ආකාරගත ස්වාධීනත්වයෙන් අනතුරුව දශක ගනනාවක් තිස්සේ, කොංග්‍රසය, ජාතික හා ප්‍රාන්ත මට්ටම්වල ඉන්දියානු දේශපාලන වේදිකාව තුල මුලුමනින්ම ආධිපත්‍යය දැරී ය. 1996 දී එය බලයෙන් පහ කෙරුනු අවස්ථාව දක්වා ම, මෙම පක්ෂය, තෙවසරක වාරයන් දෙකක් හැරුනු කොට, ජාතික මට්ටමේ දිගටම බලයේ සිට ඇත. අද, එය, සිය අතීතයේ ම සෙවනැල්ල බවට පත්ව ඇත. මහජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටින බවට එය කරන කියාපෑම්, කීතු වී ඇති අතර, එහි සහයෝගී පදනම් ශීඝ්‍රයෙන් වියැකී යමින් පවතී.

1999 පැවති අවසන් ජාතික මැතිවරනයේ දී, කොංග්‍රසය හින්දු අධිපතිවාදී බීජේපීය විසින් පරාජයට පත් කෙරුනු අතර, එයට දිනාගත හැකි වූයේ, ලෝක් සභාවේ, එනම්, පාර්ලිමේන්තුවේ පහල මන්ත්‍රී මන්ඩලයේ, ආසන 545න් 112ක් පමනි. බීජේපීය දිනාගත් ආසන 182 පාර්ලිමේන්තුවේ බහුතරයක් ලබා ගැනුම සඳහා ප්‍රමානවත් නො වුන ද කුඩා පක්ෂ ගනනාවත් හා එක්ව ජාතික ප්‍රජාතන්ත්‍ර සන්ධානය (එන්ඩීඒ) නමින් සභාගයක් තනාගැනීමට එයට හැකි විය. කොංග්‍රසය සමත් වූයේ, ආසන 22ක එකතුවකින් යුත් පක්ෂ කිහිපයක සහාය දිනාගැනීමට පමනි.

ධනවතුන් හා දුගීන් අතර පරතරය පුලුල් කිරීමට තුඩු දී ඇති එන්ඩීඒ ආන්ඩුවේ ආර්ථික ප්‍රතිව්‍යුහකරන වැඩපිලිවෙලට එරෙහිව වැඩෙන වෛරය තිබිය දී ම, මෙම මැතිවරනයේ දී, කොංග්‍රසය මොන යම් හෝ සැලකිය යුතු වාසියක් ලබාගතැයි අපේක්ෂා කල නො හැක. ලන්ඩනයෙන් පල වන *ඉකොනමිස්ට්* සඟරාවට අනුව, "පක්ෂ මූලෝපායඥයන් පවා කියන්නේ, එයට ලබා ගත හැකි උපරිමය (ආසන) 135ක් පමන වන" බවයි. කෙසේ වෙතත්, පක්ෂයේ තත්වය බොහෝ සෙයින් ඊටත් නරක විය හැකි ය. පසුගිය දෙසැම්බරයේ දී පැවති ප්‍රාන්ත මැතිවරනවල දී, ප්‍රාන්ත හතරෙන් තුනක -- රාජස්ථාන්, මධ්‍ය ප්‍රදේශ සහ චතිස්ගාර් -- කොංග්‍රසය අතු ගෑවී ගියේ ය.

කොංග්‍රසයේ පල්ලම් බැසීම පෙන්නුම් කරන එක් සලකුනක් නම්, ප්‍රාදේශීය පදනම් සහිත පක්ෂ සමග මැතිවරන සන්ධාන සඳහා හැරීගැනීමට පක්ෂයට බල කෙරී තිබීමයි. භාෂාව, ජනවර්ගය සහ කුලය මත පදනම්ව ප්‍රාදේශීය අගතීන් අවුලුවාලමින් 1990 ගනන්වල දී මෙම පක්ෂ ඉස්මත්තට පැමිනීම වනාහි, ප්‍රධාන පක්ෂවලින් මහජනයා පුලුල් ලෙස විරසක වීමේ තවත් පිලිබිඹුවකි. මීට කලින් පැවති මැතිවරනවල දී, කොංග්‍රසය, මැතිවරන ගිවිසුම්වලට යාමෙන් වැලකුනේ, එවන් සන්ධාන අනවශ්‍ය බවත් ඒවා මගින් සිය ජාතික ප්‍රතිරූපයට වල කැපෙන බවත් විශ්වාස කරමිනි.

දැන්, කෙසේ වෙතත්, කොංග්‍රසය හවුල්කරුවන් සොයාගැනීමෙහි ලා මංමුලා සහගත වී ඇති අතර, මූලික ප්‍රාන්ත ගනනාවක පහල මට්ටමේ තත්වයක් පිලිගැනීමට ද ඔවුනට සිදුව තිබේ. බිහාරයේ රාෂ්ට්‍රීය ජනතා දාල් (ආර්ජේඩී) සමග ඇති කර ගැනුනු සන්ධානයේ දී, ප්‍රාන්තයට අයත් ජාතික පාර්ලිමේන්තු ආසන 40න් 4ක් පමනක් ලැබීමෙන් සෑහීමට පත්වීමට කොංග්‍රසයට සිදුවී ඇත. එය වනාහි එය ඉල්ලා සිටි ආසන සංඛ්‍යාව වන 14ට වඩා බෙහෙවින් අඩු ප්‍රමානයකි. කොංග්‍රසය ආන්ද්‍ර ප්‍රදේශ්, මහාරාෂ්ට්‍ර සහ තමිල්නාඩු යන ප්‍රාන්තවල ද සන්ධාන තනාගෙන ඇත. එහෙත්, වඩාත් ම ජනාකීර්න ප්‍රාන්තය වන උත්තර් ප්‍රදේශ්හි, බහුජන සමාජ පක්ෂය සහ සමාජවාදී පක්ෂය, කොංග්‍රසයේ ඉල්ලීම ඉවත දමා තිබේ. මෙම ප්‍රාන්තයේ ආසන 80න් කොංග්‍රසය දැනට බලය දරන්නේ ආසන 9ක පමනි.

මෙම පක්ෂයේ බංකොලොත්කම අවධාරනය කෙරෙන පැහැදිලිම සාධකය නම්, නේරු-ගාන්ධි ප්‍රභූ-වංශය මත රඳා පැවැත්මට එයට සිදුව තිබීමයි. ඝාතනයට ලක්වූ අගමැති රජීව් ගාන්ධිගේ වැන්දඹුව වන ඉතාලියේ උපන් සෝනියා ගාන්ධිට, පක්ෂයේ නායකත්වය ගැනීමට බල කෙරී ඇතුවා පමනක් නො ව. ඇගේ දරුවන් දෙදෙනා ද මැතිවරන උද්ඝෝෂනයට එක් කර ගෙන තිබේ. උත්තර් ප්‍රදේශ් ප්‍රාන්තය තුල

පක්ෂයේ තත්වය ඉහල දමා ගැනීමේ ප්‍රයත්නයක් ලෙස, ඇගේ පුත් රාහුල්, එම ප්‍රාන්තයේ අමෙති අසුනේ කොංග්‍රස් අපේක්ෂකයා ලෙස තරඟ වදී. ඔහුගේ සොයුරිය වන ප්‍රියංකා ද එම අසුනේ මැතිවරන උද්ඝෝෂනය තුල ප්‍රමුඛ ක්‍රියාකලාපයක් ඉටු කරයි.

ඉන්දියාවේ වැඩ කරන ජනතාවගේ අවශ්‍යතා නියෝජනය කරන බවට කොංග්‍රසය කරන කියාපෑම්වලින් දැන් ඉතිරිව ඇත්තේ, යටත් විජිත විරෝධී ව්‍යාපාරයේ නායකයන්ට -- මහත්මා ගාන්ධිට හා ජවහර්ලාල් නේරුට -- පක්ෂයේ පවත්නා තුනී බැඳීම් පමනි. කොංග්‍රසය නිරතුරුවම. ඉන්දියානු ධනේශ්වරයේ පක්ෂයක් විය. එයට අවශ්‍ය වූයේ, බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි දැවැන්ත මහජන ව්‍යාපාරය, කිසිදාක, පුද්ගලික දේපොල ක්‍රමයට තර්ජනය නො කරන බවත් තමන්ගේ ම වරප්‍රසාදිත තත්වයන් රැක ගැනීමේ මාධ්‍යයක් බවට එය පත් කරගැනීමත් සහතික කරගැනීමට ය. එමෙන් ම, යටත් විජිත විරෝධි ව්‍යාපාරය තුල තමන් දැරූ නායකත්වය හරහා, කොංග්‍රසය, ගැඹුරු දේශපාලන පදනම් ද ප්‍රගතිශීලී වෙනසක් සඳහා ක්‍රියා කරන පක්ෂයක් ලෙස, කීර්තියක් ද තහවුරු කරගති. බ්‍රිතාන්‍ය පාලනය හමාර වීමෙන් පසුව දේශපාලන කරලිය තුල ආධිපත්‍යය දැරීමට එයට හැකිවූයේ ඒ නිසා ය.

වඩ වඩා පිරිහීමට ලක් වූ සිය ප්‍රතිරූපය රැකගැනීමට කොංග්‍රසය සමත් වූයේ, දෙවන ලෝක යුද්ධයෙන් අනතුරුව පැවති සුවිශේෂ භූගෝලීය ආර්ථික හා දේශපාලන කොන්දේසිවල ප්‍රතිඵලයක් ලෙස ය. ආනයන ආදේශය මත පදනම් වූ, අතිශයින් පරිපාලිත ජාතික ආර්ථිකයක් පවත්වා ගෙන යාමටත් කම්කරුවන්ට හා පීඩිත මහජනතාවට සීමිත සහන ප්‍රදානය කිරීමටත්, අනුප්‍රාප්තික ඉන්දියානු ආන්ඩු සමත් විය. ශීතල යුද්ධයේ සන්දර්භය තුල, වොෂිංටනය හා මොස්කෝව අතර තුලනය වෙමින්, ස්ටැලින්වාදී නිලධරයේ සහාය ඇතිව, "අධිරාජ්‍ය-විරෝධී" මවාපෑමක් පවත්වාගෙන යාමටත්, කොංග්‍රස් නායකයන්ට හැකි විය. ඉන්දියාව, ඒනියා නොබැඳි ව්‍යාපාරයේ නායකයෙක් ද විය.

කෙසේ වෙතත්, 1980 ගනන්වල හා 1990 ගනන්වල දී, භූගෝලීයකරනයේ ක්‍රියාදාමයන් මගින්, ජාතික ආර්ථික පරිපාලනයේ සියලු රූපාකාරයන්ට යටින් වල කැපිනි. මෙහි තියුනුම ප්‍රකාශනය වූයේ සෝවියට් සංගමයේ කඩාවැටීමයි. ඉන්දියාව තුල මෙහි බලපෑම, ප්‍රගාඪත්වයෙන් ඊට වඩා අඩු නො වී ය. 1990 ගනන් මුල දී, අගමැති නරසිම්හ රාඕගේ කොංග්‍රස් ආන්ඩුව, වෙලඳ පොල ප්‍රතිසංස්කරනවල ආරම්භක පියවර සඳහා මුල පුරමින්, රටේ දැවැන්ත ලාභ ශ්‍රම සම්පත් විදේශ ආයෝජකයන්ට විවෘත කලේ ය. ව්‍යාපාරික හා මධ්‍යම පන්තික තට්ටුවක් මෙයින් වාසි ඩැහැගත් අතර, ආර්ථික ප්‍රතිව්‍යුහකරනයේ ප්‍රතිඵලයේ වූයේ, කම්කරු පන්තියේ හා පීඩිත මහජනතාවගේ ජීවන මට්ටම් මත දැවැන්ත ප්‍රහාරයන් මාලාවක් එල්ල වීමයි. වැඩෙන මහජන වෛරය, 1996 මැතිවරනයේ දී පක්ෂය ලද පරාජය සඳහා ප්‍රධාන හේතුව විය.

## බීජේපීයට විකල්පයක් නො වේ

බීජේපීය කොංග්‍රසය පිලිබඳ මහජන අසන්තෘප්තිය සිය වාසියට යොදාගත් අතරම, 1998 සිට මේ දක්වා එම ප්‍රතිව්‍යුහකරන වැඩපිලිවෙල ම ක්‍රියාවට දමා ඇත. විදේශ ආයෝජකයෝ, ඉන්දියාවේ අඩු මිල, උගත්, ඉංග්‍රීසි කතා කරන, ශ්‍රම බලකාය, සූරා කමින්, පරිගනක, පර්යේෂන හා කාර්යාල සේවාවන් පුලුල් පරාසයක් නිර්මානය කොට, ඉන්දියානු මධ්‍යම පන්ති ස්ථරයන්ට වාසි සලසා ඇති වේගවත් වර්ධනයක් උපදවා තිබේ. බීඩේපීයේ මැතිවරන උද්ඝෝෂනය කේන්ද්‍රගත වී ඇත්තේ, ඉන්දියාවේ ආර්ථික වර්ධනයේ හා ජාත්‍යන්තර පිලිගැනීමේ වාහකයා ලෙස පක්ෂය පින්තාරු කිරීම ඉලක්ක කර ගත්, රජයේ වියදමින් පවත්වා ගෙන යන, "දිදුලන ඉන්දියාව" නම් වූ ප්‍රහාරාත්මක මාධ්‍ය ප්‍රචාරක ව්‍යාපාරයක් වටා ය.

ආන්ඩුවේ ආර්ථික පිලිවෙත්, තව දුරටත් දරිද්‍රතාවේ ගිලී සිටින ජනහගනයේ අති මහත් බහුතරය සහ ධනවතුන් අතර පවත්නා ගැඹුරු සමාජ ආගාධය පුලුල් කිරීමට තුඩු දී ඇත යන කරුන, ආන්ඩුවේ චාටුකාර මාධ්‍ය ප්‍රචාරක ව්‍යාපාරය විසින් නො තකා හරිනු ලැබ ඇත. බීජේපීයේ වාර්තාවට පහර ගැසීමේ සිය ප්‍රයත්නයේ දී, කොංග්‍රසය අති මූලික ගැටලුවකට මුහුන දී සිටී: එනම්, ඔවුනගේ පිලිවෙත් ආන්ඩුවේ පිලිවෙත්වලින් වෙනස් නො වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, කොංග්‍රසයේ මැතිවරන ප්‍රචාරය ප්‍රතිවිරෝධතාවලින් පිරී තිබේ: කොංග්‍රසය, මහජනතාවගේ ජීවන කොන්දේසි නංවන බවට හිස් පොරොන්දු දෙමින්, ඔවුන් රවටන අතරම, විවෘත වෙලඳ පොල න්‍යාය පත්‍රය ඉදිරියට ගෙනයාමෙහි ලා තමනට පවතින හැකියාව පිලිබඳව මහ ව්‍යාපාරිකයන් ඒත්තුගැන්වීමේ ප්‍රයත්නයක ද යෙදී සිටී.

එනයින් පක්ෂයේ මැතිවරන ප්‍රකාශය මෙසේ උදම් අනයි: "ලිබරලීකරනය සහ ආර්ථික ප්‍රතිසංස්කරන දියත් කලේ කොංග්‍රසයයි. 1998 වන විට ඉන්දියාව ලෝකයේ සිවු වන විශාලතම ආර්ථිකය බවට පත් කලේ කොංග්‍රසයේ පිලිවෙත් මගිනි." එපමනක් නොව, පුද්ගලික ආයෝජකයන්ට තව දුරටත් මූල්‍ය දිරිගැන්වීම් සපයන බවටත් විදේශ ආයෝජනවලට අනුමැතිය දීමේ පද්ධතිය, "වඩා පාරදෘශ්‍ය" බවට පත් කිරීම මගින් වැඩි දියුනු කරන බවටත් කොංග්‍රසය පොරොන්දු වෙයි.

බීජේපීයේ පිලිවෙත් දිගටම ඉදිරියට ගෙන යන බවටත් ඒවා පුලුල් කරන බවටත් පොරොන්දු වන ගමන් ම, කොංග්‍රසය, වැඩෙන විරැකියාව හා ග්‍රාමීය දරිද්‍රතාව සම්බන්ධයෙන් ආන්ඩුවට දොස් පවරයි.

ගම්බද ජනතාවට ආයාචනය කරනු වස්, එහි මැතිවරන ප්‍රකාශය, ගම්බද එක් එක් පවුලේ එක සාමාර්කයකුට "වත්කම් නිර්මානය කරන පොදු වැඩ ව්‍යාපෘතිවල, අවම වැටුපක් යටතේ වසරකට අඩු ගනනේ වැඩ දින 100ක්" සපයන, "ජාතික රැකියා සහතික පනතක්" ඉල්ලා සිටී.

එන්ඩීඒ ආන්ඩුවේ කම්කරු පන්ති විරෝධී පියවරවලට සහාය දීමට කොංග්‍රසය දක්වා ඇති කැමැත්ත මගින්, පක්ෂයේ පොරොන්දුවල හිස් ස්වභාවය එලිදරව් වෙයි. රාජ්‍ය අංශයේ වර්ජන අයිතිය අහෝසි කරමින් ගිය වසරේ ශ්‍රේෂ්ඨාධිකරනය දුන් තීන්දුවකට විරෝධය දක්වනු වස් පෙබරවාරි 24 දා මිලියන 50කට අධික කම්කරුවන් වර්ජනය කල විට, කොංග්‍රසය, එම කාර්මික ක්‍රියාවට විරුද්ධත්වය දැක්වීමෙහි ලා බීජේපීය සමග පෙල ගැසුනි. හාම්පුතුනට රිසි පරිදි කම්කරුවන් බඳවා ගැනීමට හා දොට්ට දැමීමට ඇති හැකියාව වලකන නීතිමය බාධාවන් තව දුරටත් ලිහිල් කරනු පිනිස, කමකරු නීතිවලට බීජේපීය යෝජනා කර ඇති පුලුල් වෙනස්කම් සම්බන්ධයෙන්, කොංග්‍රසයේ මැතිවරන ප්‍රකාශය භයංකර ලෙස නිහඬව සිටීම ද අර්ථභාරී ය.

සෙසු කරුනු සම්බන්ධයෙන් කොංග්‍රසය දරන ආස්ථානයන් ද එමෙන් ම ප්‍රතිවිරෝධී ය. ශීතල යුද්ධයේ කාල පරිච්ඡේදයේ දී, මෙම පක්ෂය නොබැඳි පිලිවෙතෙහි ප්‍රමුඛ උද්ඝෝෂකයෙකි. දැන්, කෙසේ වෙතත්, එය, බුෂ් පරිපාලනය සමග සමීප මූලෝපායික හා මිලිටරි සබඳතා තනාගැනීමේ බීජේපීයේ පිලිවෙතට, නිහඬව සහාය දෙයි. කොංග්‍රස් ආන්ඩුවක් "එක්සත් ජනපදය සමග විද්‍යාත්මක, තාක්ෂනික, මූලෝපායික හා වානිජ සහයෝගිතාවක යෙදෙන" බව, එහි මැතිවරන ප්‍රකාශය මෘදු ලෙස ප්‍රකාශ කර සිටී. එහෙත් එහි විදේශ පිලිවෙත පිලිබඳ නියම පරික්ෂනය නම්, එක්සත් ජනපදය ඉරාකයේ පවත්වාගෙන යන නීති විරෝධී වාඩිලාගැනීම සම්බන්ධයෙන් දක්වා ඇති ආකල්පයයි. කොංග්‍රස් නායකයන්, කිසිදු අති මූලික අර්ථයකින්, එක්සත් ජනපද ආක්‍රමනයට අභියෝග නො කල අතර, ඔවුන් කියා සිටියේ, එය එක්සත් ජාතීන්ගේ කුඩය යටතේ සිදු විය යුතු බව පමනි. පසුගිය ජූනි මස, ඉරාකයට ඉන්දියානු හමුදා යැවිය යුතු යයි වොෂිංටනය බල කල විට, සෝනියා ගාන්ධි අගමැති හමුවී, කොංග්‍රසය එයට විරුද්ධ නො වන බව සහතික කලා ය.

"ජාතික ආරක්ෂාවේ" නාමයෙන්, කොංග්‍රසය, බීජේපීයටත් වඩා මිලිටරිවාදී ආස්ථානයක් පවා ගනිමින්, ආරක්ෂක හමුදාවන් ප්‍රමානවත් පරිදි ශක්තිමත් කිරීමට ආන්ඩුව අපොහොසත් වී ඇතැයි එය විවේචනයට ලක් කොට තිබේ. "අපගේ හමුදාවන් නවීකරනය කිරීමෙහි ලා පවත්නා සියලු ප්‍රමාදයන් ඉවත් කෙරෙන බවටත් නවීකරනය සඳහා අයවැයෙන් වෙන් කෙරුනු අරමුදල් පරිපූර්නව, තථ්‍ය වසයෙන් ම, ඒ වෙනුවෙන් වැය කෙරෙන බවටත්, කොංග්‍රසය සහතික කරනු ඇත." එවන් පිලිවෙතක්, කලාපය තුල -- විශේෂයෙන් ම පකිස්ථානය සමග -- ආතතීන් තව දුරටත් උත්සන්න කරනු ඇත.

අතීතයේ දී, කොංග්‍රසය, තමන් අනාගමික යයි කියාපාමින්, බීජේපීයේ හින්දු අධිපතිවාදයෙන් වෙන් වී ගැනීමට ප්‍රයත්න දරා තිබේ. එහෙත්, දේශපාලන අරමුන වෙනුවෙන් ජාතිවාදී ආතතීන් ගසාකෑමේ දිගු ඉතිහාසයක්, මෙම පක්ෂයට පවතී. එය වනාහි, බ්‍රිතාන්‍ය විජිත ඉන්දියාව, මුස්ලිම් පකිස්ථානයක් හා හින්දු ආධිපත්‍යයකින් යුත් ඉන්දියාවක් බවට බෙදීමේ ව්‍යසනකාරී ක්‍රියාවට සහයෝගය දීම දක්වාම, අතීතයට දිවෙන ඉතිහාසයකි. කොංග්‍රසය යටතේ ඉන්දියාව පකිස්ථානය සමග තුන් වතාවක් ම යුද වැදුනු අතර, ඉස්ලාමාබාද් පාලනය හෙලා දැකීමෙහි ලා. කොංග්‍රසය, බීජේපීය මෙන් ම රුදුරු ලෙස ක්‍රියා කරයි.

කෙසේ වෙතත්, බීජේපීයේ නැගීමත් සමග, කොංග්‍රසය, බීජේපීයේ හින්දුත්වා පිලිවෙතට නැත හොත් හින්දු ස්වෝත්තමවාදයට වඩ වඩා අනුගත වී තිබේ. 2002 වසරේ ගුජරාට් ප්‍රාන්ත මැතිවරනයේ දී, කොංග්‍රසයේ උද්ඝෝෂනය කෙතරම් නම් නින්දිත ද කිය තොත්, මාධ්‍ය විසින් එහි පිලිවෙත්වලට "සැහැල්ලු-හින්දුත්වා" යන නම පට බඳින ලදි. 1992 දෙසැම්බරයේ දී හින්දු උන්මත්තක කල්ලි විසින් අයෝධ්‍යාවේ බබ්රි මස්ජිඩ් මුස්ලිම් පල්ලිය බිමට සමතලා කිරීම පිලිබඳ කොංග්‍රසය දරන ආකල්පය, එහි පිලිවෙත සම්බන්ධයෙන් එලිදරව්කාරී ය. එම ස්ථානයේ හින්දු කෝවිලක් තැනීමට ඇති "අයිතිය" සම්බන්ධයෙන් හින්දු වර්ගෝත්තමවාදීන් ප්‍රකෝපකාරී උද්ඝෝෂනයක යෙදී සිටින අතර, කොංග්‍රසය, එම ඉල්ලීමට ක්‍රියාකාරීව සහයෝගය නො දෙන නමුත්, බීජේපීය මෙන්ම, ඔවුන් ද ප්‍රකාශ කරන්නේ, එය අධිකරනය විසින් තීන්දු කල යුතු කාරනාවක් බව ය.

තම පක්ෂය, බීජේපීයට සන්සන්දනාත්මව, මොන යම් හෝ ආකාරයකින්, අඩු නපුර නියෝජනය කරන්නේ ය යන විනිවිද පෙනෙන ප්‍රෝඩාව පවත්වා ගෙන යාමෙහි ලා, කොංග්‍රසය බොහෝ සෙයින් වාරු වී සිටින්නේ, ප්‍රධාන ස්ටැලින්වාදී පක්ෂ දෙක මත ය. එනම්, මාක්ස්වාදී ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (සීපීඅයි-එම්) සහ ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (සීපීඅයි) මත ය. සීපීඅයි-එම් සහ සීපීඅයි, කොංග්‍රසය, ප්‍රගතිශීලී හා සමාජවාදී පවා වන විකල්පයක් නියෝජනය කරන්නේ ය යන මිථ්‍යාව, වැඩ කරන ජනතාව අතර හිතාමතාම වගාදිගා කිරීමට, දශක ගනනාවක් තිස්සේ, විවිධ ආකාරයෙන්, ක්‍රියා කොට තිබේ. අද, ස්ටැලින්වාදියෝ, තමිල්නාඩු ප්‍රාන්තයේ දී කොංග්‍රසය සමග සන්ධානයක් තනාගෙන ඇති අතර, බීජේපීයට සන්සන්දනාත්මකව, කොංග්‍රසය අඩු ගනනේ

"අනාගමික" ය යන අතිශය තුනී තර්කය මත පදනම්ව, කොංග්‍රස් ආන්ඩුවකට පිටත සිට සහාය දීමට ද පොරොන්දු වී තිබේ.

කොංග්‍රසයේ මැතිවරන වාසි සඳහා බිකිම දීමෙහි ලා සීපීඅයි-එම් හා සීපීඅයි පක්ෂවලට පවත්නා හැකියාව ද අතිශය සීමිත ය. දශක ගනනාවක දූෂ්ය පාවාදීම්වලට පසුව, විශේෂයෙන් ම බටහිර බෙංගාලයේ හා කේරලයේ සීපීඅයි-එම් පාලන කාලය තුල කෙරුනු පාවාදීම්වලට පසුව, මෙම පක්ෂ දෙකම, මහජනතාවගේ ඇස් ඉදිරියේ ගැඹුරින්ම අපකීර්තියට පත්ව තිබේ. පක්ෂ දෙකම, මාක්ස්වාදයට දක්වන ආකාරගත බැඳීම පවා මුලුමනින් ම පාහේ අතහැර දමා, ප්‍රධාන ධනේශ්වර පක්ෂ -- කොංග්‍රසය මෙන් ම බීජේපීය ද -- සමග හොර ගනුදෙනුවල යෙදෙමින්, ඉන්දියානු දේශපාලන සංස්ථාපිතයේ පක්ෂපාතී කොටස්කරුවකු බවට පත්ව තිබේ.

කොංග්‍රසයට මුක්කු ගැසීමේ මෙම සියලු ප්‍රයත්නයෝ, එහි අඛන්ඩ පල්ලම් බැසීම වලකාලීමට සමත් නො වනු ඇත. පාලක ප්‍රභූන් සම්බන්ධයෙන් සලකන තාක් දුරට, බීජේපීය සැලකෙන්නේ, අඩු ගනනේ මේ මොහොතේ දී, සිය ආර්ථික හා මූලෝපායික න්‍යාය පත්‍රය ඉදිරියට ගෙනයාම සඳහා වූ හොඳම දේශපාලන වාහකය ලෙස යි. දශක ගනනාවක කඩවුනු පොරොන්දු හා බේගල්වලට පසුව, ජනගහනයේ අති මහත් බහුතරය, අඩු නපුරක් ලෙස පවා, කොංග්‍රසයට ඡන්දය දීමේ සූදානමක් නැත.

© www.wsws.org